# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2298/27 - 2022 සැප්තැම්බර් මස 21 වැනි බදාදා - 2022.09.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත**

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 39 වන වගන්තිය යටතේ ඉංජිනේරු සභාව විසින් සාදන ලද රීති.

තිලක් ද සිල්වා,
සභාපති,
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය රීතිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය*

2017 අංක 4 දරන පනත මගින් සංස්ථාපනය කර පිහිටුවන ලදී.

1A - PG 5997 — 11 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 13 (ඌ) සහ (එ) වගන්තිය අනුව ඉංජිනේරු වෘත්තිකයෙක් සම්බන්ධයෙන් වන විනය පරීක්ෂණ සඳහා වූ කාර්ය පටිපාටිය

### පූර්විකාව

ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලයක් තිස්සේ ඉංජිනේරු වෘත්තිකයන් සඳහා පොදු සහ ස්ථාවර විනය පරීක්ෂණ කාර්ය පටිපාටියක් පැවතීමේ අවශ්‍යතාව හඳුනා ගෙන ඇත. මෙම කාර්යයේ දී ඉංජිනේරු වෘත්තිකයන් අතරේ වෘත්තීය විෂමාචාර මෙන් ම අවකල් ක්‍රියා ද, භේදවීම් මෙන් ම ආරවුල් ද, වෘත්තීය කටයුතු සහ කාර්යය ඉටු කරන අතරතුර දී ඔවුන්ගේ වෘත්තීය කාර්යය සහ ඒවායේ ප්‍රතිඵල අඩු වෙන ආකාරයෙන් වෘත්තීය අවහිරතා සහ බාධා ලෙස පැන නගින වැරදි අර්ථකථන පිළිබඳ පරීක්ෂණ ද පවත්වනු ලැබේ. ඒ අනුව ඉංජිනේරු වෘත්තිකයන්ගේ විනය පරීක්ෂණ සඳහා වන මෙම කාර්යය පටිපාටිය විරෝධතා විසඳීම මෙන් ම ඒකඟතාවයට මාර්ග සකස් කිරීම යන වඩා හොඳ කාර්යය සඳහා හඳුන්වා දී ඇත. එහෙත් වෘත්තීය විෂමාචාර හෝ අවකල් ක්‍රියා යම් නො සලකා හැරීමක් හෝ යම් අභිප්‍රායක් හේතුවෙන් සිදු වේ නම් සියලු පාර්ශව එනම් ඉංජිනේරු වෘත්තිකයන් අතරේ පමණක් නොව තුන් වන පාර්ශවයක් හෝ මෙම වෘත්තියෙන් පරිබාහිර තැනැත්තන් යන දෙයාකාරයෙන් එක් ආකාරයක පැමිණිලිකරුවන්ගේ පැමිණිලි පිළිබඳවත් ඇති සම්බන්ධතා නිරවද්‍ය කිරීමෙන් පසුව එවැනි දෑ ඉංජිනේරු වෘත්තියෙන් මුලිනුපුටා දැමිය යුතු ය. වෘත්තීය රාමුවක් තුළ කුසලතාවයන් සහ වෘත්තීය පැවැත්ම වැඩි දියුණු කිරීම පිණිස වෘත්තිමය විනය පරීක්ෂණ මාර්ගෝපදේශ සමගින් යහපැවැත්මෙන් සහ අව්‍යාජභාවයෙන් අනූන වූ සම්බන්ධයක් පැවතිය යුතු ය. විනය පරීක්ෂණය සඳහා වූ කාර්ය පටිපාටිය ආචාරධර්ම සංග්‍රහයට අනුව මෙන් ම රටේ නීතිය සහ සාධාරණත්වය සමඟ හා/හෝ අනුව ක්‍රියාත්මක කළ යුතු ය. මෙම කාර්යය සඳහා ඉංජිනේරු වෘත්තිකයන් සඳහා වන විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය, 2017 අංක 4 දරන ඉංජිනේරු සභාව පනතේ 13 (ඌ) සහ (එ) වගන්ති අනුව සභාවට පවරන ලද බලතල යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අනුමැතිය ඇති ව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### පසුබිම

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 12(ඇ) වගන්තියෙන් හඳුන්වා දී ඇති කාර්යයන් සපුරාලීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 13 (ඌ) සහ (එ) වගන්තිය යටතේ සාදනු ලැබ ඇති විනය පරීක්ෂණ කාර්ය පටිපාටියට සභාවේ වෙනත් කාර්යයන් අතර ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය විෂමාචාරවලට අදාළ යම් කාරණා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට බලය පවරා ඇත. ආචාරධර්ම පද්ධතිය මෙන් ම රටේ නීතියට සහ යුක්තියට අනුකූලව මෙම කාර්ය පටිපාටියේ සියලු පියවර පවත්වාගෙන යාම සහ තීරණ වලට එළඹීම සිදු කළ යුතු ය. ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ සභාවේ (ECSL) විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය ප්‍රකාශයට පත් කිරීමේ දී, මෙම පනත මඟින් පවරන ලද බලතල යටතේ ගරු අමාත්‍යවරයා විසින් නියෝග ලෙස *ගැසට් පත්‍රය* පළ කරන ලද අදාළ මාර්ගෝපදේශ සභාව විසින් පිළිපැදිය යුතු ව ඇත.

### වෘත්තීය විෂමාචාර

ඉංජිනේරු වෘත්තිකයකුගේ වෘත්තීමය විෂමාචාර පිළිබඳ හැඳින්වීමට සහ අර්ථ නිරූපණයට අනුව සභාවේ ඉංජිනේරු වෘත්තිකයන්ගේ සියලු ආකාරයේ වෘත්තිමය විෂමාචාර චෝදනා පිළිබඳ කටයුතු කර ගෙන යාම පිණිස මෙම විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය සභාව විසින් අනුමත කරනු ලැබ ඇත. මෙම කාර්ය පටිපාටිවල දක්වා ඇති බලතල මගින් සභාපතිවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට, පැමිණිලි ලේකම්වරයාට, මූලික විමර්ශන කමිටුවට, විමර්ශන නිලධරයාට, විනය කමිටුවට සහ විනය මණ්ඩලයට, විනය මණ්ඩලයේ සභාපතිවරයාට ඒ සිදු කළා යයි කියන වෘත්තිමය විෂමාචාර පිළිබඳ විමර්ශන පවත්වා විනිශ්චය කිරීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනතේ විධිවිධාන වලට අනුකූලව සුදුසු වාරණ නියම කිරීමට සහ යම් ක්‍රියාවක් හෝ නො කර හැරීමක් වෘත්තිමය විෂමාචාරයකට මුල් වී ඇති බවට ඔප්පු වන්නේ නම් වෙනත් දේ අතර විනය පාලන රීති ක්‍රියාත්මක කිරීමට බලය පවරා ඇත.

### අර්ථ නිරූපණ සහ කෙටි යෙදුම්

(*අ*) පනත යන්නෙන්, 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනත අදහස් වේ.

(*ආ*) ශ්‍රී.ල.ඉ.ස. (ECSL) යන්නෙන්, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව අදහස් වේ.

(*ඇ*) පැමිණිලි ලේකම්වරයා යන්නෙන්, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව විසින් පත් කරනු ලබන පැමිණිලි ලේකම්වරයා අදහස් වේ.

(*ඈ*) මූලික විමර්ශන මණ්ඩලය යන්නෙන්, සභාව විසින් පත් කරන පුද්ගලයන් පස් දෙනෙකුට (5) නො වැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු මණ්ඩලයක් අදහස් වේ.

(*ඉ*) මූලික විමර්ශන කමිටුව යන්නෙන්, පැමිණිලි ලේකම්වරයා විසින් මූලික විමර්ශන මණ්ඩලයෙන් පත් කරනු ලබන තැනැත්තන් තිදෙනකු අදහස් වේ.

(*ඊ*) විනය මණ්ඩලය යන්නෙන්, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන රීති, නියෝග සහ නීති වලට අනුව විනය පරීක්ෂණයක් පැවැත්වීමට සුදුසුකම් ඇති සභාවේ සාමාජිකයන්ගෙන් හෝ සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් හෝ දෙපාර්ශවයෙන්ම තැනැත්තන් 7 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත මණ්ඩලයක් අදහස් වේ.

(ඌ) විනය කමිටුව යන්නෙන්, පැමිණිලි ලේකම්වරයා විසින් විනය පරීක්ෂණ මණ්ඩලයෙන් තෝරා ගන්නා ලද තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් අදහස් වේ.

(ඍ) පරීක්ෂක යන්නෙන්, මූලික විමර්ශන කමිටුවෙන් තෝරා පත් කර ගන්නා එක් තැනැත්තෙකු අදහස් වේ.

(එ) මෙම කාර්ය පටිපාටියේ භාවිතා කරන "විෂමාචාර" යන වචනයෙන් 2017 අංක 4 දරන පනතේ 16 (6) වන වගන්තිය අනුව ගරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති නීත්‍යානුකූල තත්ත්වය යටතේ ඔහු හෝ ඇය විසින් සම්මත කරනු ලබන නියෝග සහ ඒ මගින් හඳුන්වා දිය හැකි, ඇතුළත් වන සියලු ක්‍රියාවන් සහ/හෝ නොකර හැරීම් ද අදහස් වේ.

**විනය පරීක්ෂණ කාර්ය පටිපාටිය**

ඉංජිනේරු වෘත්තිකයකුගේ වෘත්තීය විෂමාචාර පිළබඳ සියලු චෝදනා මෙම කාර්ය පටිපාටිය යටතේ විමර්ශනය කළ යුතු ය.

1. සභාව විසින් ඉංජිනේරු වෘත්තිකයන්ට අදාළව චෝදනා, පැමිණිලි, ආරවුල් සහ ගැටුම් ආකාර හතකින් හඳුනාගෙන ඇත එනම්,

(අ) ඉංජිනේරු වෘත්තිකයන් අතර වෘත්තීය නො සලකා හැරීම්වලට අදාළ ඉංජිනේරු වෘත්තිමය ආරවුල්

(ආ) ඉංජිනේරු වෘත්තිකයන් සහ තුන්වන පාර්ශවයක් (පාර්ශවයන්) අතර ඇතිවන ආරවුලක්, (තුන්වැනි පාර්ශවය යන්නෙන් ඉංජිනේරුවරයෙකු නොවන යම් තැනැත්තෙකු හෝ ඉංජිනේරු කටයුත්තක නිරත නොවන යම් නීත්‍යානුකූල තැනැත්තෙකු අදහස් වේ).

(ඇ) ඉංජිනේරු වෘත්තිකයන් සහ/හෝ ඉංජිනේරු වෘත්තීමය ආයතනයක්/ආයතන හෝ ලියාපදිංචි සහ පිළිගත් ඉංජිනේරු උපදේශන සංවිධාන හෝ ආයතන අතරේ ඇති වන ආරවුල්.

(ඈ) ශ්‍රී.ල.ඉ.ස. පනත එහි රීති හෝ නියෝග උල්ලංඝනය කිරීම සහ වෘත්තීමය විෂමාචාරයකට හේතු වන යම් ක්‍රියාවක් හෝ නො කර හැරීමක්.

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වෘත්තීය යහපැවැත්ම සහ ආචාරධර්ම සංග්‍රහයේ යම් උල්ලංඝනය කිරීමක්.

(ඊ) පෞද්ගලික තත්වයක් (රාජකාරියට සම්බන්ධ නොවන අපරාධ වැරදි).

2. වෘත්තීමය විෂමාචාරයට අදාළ පැමිණිලි ඉංජිනේරු සභාවේ පැමිණිලි ලේකම්වරයා වෙත, පැමිණිලි ලේකම්වරයා, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව, අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යනුවෙන් ඔහුගේ හෝ ඇයගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(අ) සියලු පැමිණිලි සාවද්‍ය ක්‍රියාවක් හෝ නො කර හැරීමක් හෙළිදරව් කිරීමෙන් හෝ ප්‍රසිද්ධ කිරීමෙන් පසු කැලැන්ඩර් මාස හයක් තුළ ඉහත සඳහන් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූලව යොමු කිරීම සහ ඉදිරිපත් කිරීම කළ යුතු ය. නමුත් පුද්ගලික හේතුවක් නිසා නියමිත කාලය තුළ ඔහුගේ පැමිණිල්ල ඉදිරිපත් කිරීම වැළැක්වූ හෝ බාධා වූ නොවැළැක්විය හැකි සහ විශේෂිත කරුණු ප්‍රකාශ කරමින් ඔප්පු කිරීමට අදාළ සාක්ෂි සමඟ දිවුරුම් ප්‍රකාශයකින් නියම කළ කාලයට පසුව සාධාරණ කාලයක් තුළ යම් පැමිණිලිකරුවකු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් එය සලකා බැලීමට සභාව විසින් තීරණය කළ හැකි ය.

(ආ) පැමිණිල්ලක් ලැබී නොමැති වුව ද මාධ්‍යවල පළ වූ පුවතක් පදනම් කර ගෙන විෂමාචාර චෝදනාවන් පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ සභාව විසින් පැමිණිලි ලේකම්වරයාට නියෝග කළ හැකි ය.

(ඇ) ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ සභාව (ECSL) විසින් කිසිදු නිර්නාමික පැමිණිල්ලක් පිළිබඳ කටයුතු නොකරන අතර ඉංජිනේරු වෘත්තිකයන් පිළිබඳ වූ වෘත්තිමය විෂමාචාර පිළිබඳ චෝදනා සම්බන්ධ පැමිණිලි පමණක් සලකා බැලීම සිදු කෙරේ.

(ඈ) පැමිණිලි ලේකම්වරයා විසින් ලැබෙන සියලු පැමිණිලිවල ලැබෙන දින සහ කාලය දක්වන ලිඛිතව සටහන් කළ රෙජිස්ටරයක් පවත්වා ගෙන යා යුතු අතර තව ද පැමිණිලි ලේකම්වරයා විසින් ලිඛිත පැමිණිල්ල සමග එවූ ලියුම් කවර ද සුරක්ෂිතව තැබිය යුතු ය.

(ඉ) පැමිණිලි ලේකම්වරයා විසින් පැමිණිල්ල ලැබී දින හතක් තුළ පැමිණිල්ලේ පිටපතක් තබා ගනිමින් ඒ පැමිණිල්ල මූලික විමර්ශන කමිටුවට ඉදිපත් කිරීම සහ යොමු කිරීම කළ යුතු ය. මූලික විමර්ශන කමිටුවේ එක් සාමාජිකයෙකුගේ අත්සනින්

යුතු වෙනම රෙජිස්ටරයක ඉහත සඳහන් කළ පරිදි මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳ වාර්තා ද පැමිණිලි ලේකම්වරයා විසින් පවත්වා ගෙන යා යුතු ය.

(ඒ) පැමිණිල්ලක් මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් කරන අවස්ථාවේ දී පැමිණිලි ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයාගේ මාර්ගෝපදේශ සහ නියෝග අනුව මූලික විමර්ශන මණ්ඩලයෙන් පැමිණි තැනැත්තන් තුන් දෙනෙකුගෙන් යුත් මූලික විමර්ශන කමිටුවක් රැස් කළ යුතු ය.

3. ලිඛිතව සියලු පාර්ශවයන් කැඳවා ඔවුන්ගෙන් කරුණු සහ ආශ්‍රිත ලේඛන රැස්කිරීමට දින 14ක් තුළ පරීක්ෂකවරයෙකු පත් කිරීමට පැමිණිලි ලේකම්වරයා විසින් මූලික විමර්ශන කමිටුවට නියෝග සහ විධාන දිය යුතු ය. පරීක්ෂකවරයා මූලික විමර්ශන කමිටුවේ සාමාජික තැනැත්තෙකු විය යුතු ය.

(අ) කරුණු සහ විස්තර එකතු කරන අතරතුර එක් එක් පුද්ගල බන්ධන පාර්ශවයන් කැඳවීමට පරීක්ෂකවරයාට නීත්‍යානුකූලව අවසර ඇත. පරීක්ෂකවරයා විසින් එක් එක් පාර්ශවවල වැදගත් ලේඛන සහ ප්‍රකාශන සමග නිරීක්ෂණවල ලුහුඬු වාර්තාවක් සමග ඔහුගේ පරීක්ෂණ සැලසුම් සලකා බැලිය යුතු අතර සියලු යා කිරීම් සමග සත්‍ය ලුහුඬු වාර්තාවක් ඔවුහු පත් වී දින විසිඑකක් තුළ මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) පරීක්ෂකවයාගේ වාර්තාව සහ සියලු යා කිරීම් සහ නිරීක්ෂණ කමිටුවේ අනෙක් සාමාජිකයන් විසින් සලකා බැලිය යුතු අතර කමිටුවේ එක් එක් සාමාජිකයන් විසින් ඔවුන්ගේ නිරීක්ෂණයන් පිළිබඳ වෙනම කෙටි නිගමනයක් ඉදිරිපත් කළ යුතු අතර එය ඉදිරි නීතිමය ක්‍රියාමාර්ගයන් සඳහා විනය පරීක්ෂණ මණ්ඩලය වෙත සති දෙකක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) මූලික විමර්ශන කමිටුව විසින් විනය පරීක්ෂණ මණ්ඩලයට යොමු කළ වෙන් වෙන් වශයෙන් වන නිරීක්ෂණ සටහන් තුන සහ නිගමන ලැබුණ පසුව විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් පිළිගෙන විනය පරීක්ෂණ කමිටුවට පත් කළ පැමිණිලි ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය.

4. විනය පරීක්ෂණ මණ්ඩලය සභාව විසින් පත් කළ යුතු ය. සාමාජිකයන් හතකට නො වැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් ඉදිරියටත් තවත් වසරකින් අලුත් කළ හැකි වසරක කාලසීමාවක් සඳහා ධූරය දැරිය යුතු ය. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයාට විනය පරීක්ෂණ මණ්ඩලයේ සියලු සාමාජිකයන් පත් කිරීමට බලය පැවරී ඇත. විනය පරීක්ෂණ මණ්ඩලය ඉංජිනේරු සභාවේ සාමාජිකයකු හෝ ඉංජිනේරු සභාවේ සාමාජිකයන් නොවන දක්ෂතා ඇති යෝග්‍ය තැනැත්තකු හෝ ඒ දෙදෙනාගෙන් ම සමන්විත විය හැකි ය. සභාවේ සභාපතිවරයා විසින් විනය පරීක්ෂණ මණ්ඩලයේ සියලු සාමාජිකයන් ඉංජිනේරු සභාවේ සභාපතිවරයාගේ කැමැත්ත පරිදි තවත් වසරක දීර්ඝ කිරීමකට යටත් ව එක් කැලැන්ඩර් වර්ෂයක් සඳහා පත් කරනු ලැබේ. විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයකු සභාවේ සභාපතිවරයා විසින් විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය. විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා පරිපාලන අවශ්‍යතාවයන් පහසු කිරීම සඳහා පමණක් පත් කළ යුතු ය. විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ස්වාධීන තීරණවලට සහ/හෝ විනය පරීක්ෂණ කමිටුවේ වෙනත් සාමාජිකයන්ගේ ස්වාධීන තීරණවලට බලපෑම් කිරීමට විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාට කිසිදු බලයක් හෝ අධිකාරි බලයක් නොමැත.

(අ) මෙම කාර්ය පටිපාටියේ 3 (ඇ) ඡේදයේ සඳහන් කළ පරිදි විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් පැමිණිලි ලේකම්වරයාට දැනුම් දෙන අවස්ථාවක දී පැමිණිලි ලේකම්වරයා විසින් එක් එක් සහ සෑම දැනුම්දීමකම ඉදිරි නීති කෘත්‍යයන් සඳහා විනය පරීක්ෂණ මණ්ඩලයෙන් සැඳුම්ලත් පුද්ගලයන් තිදෙනකුගෙන් සමන්විත විනය පරීක්ෂණ කමිටුවක් නම්කර සංස්ථාපනය කළ යුතු ය.

(ආ) මූලික විමර්ශන කමිටුවෙන් ලිපි ගොනුව (අදාළ කොටස් සහ සාරාංශ සමඟ) ලැබී දින 14ක් තුළ විනය පරීක්ෂණ කමිටුව විසින් ඉංජිනේරු වෘත්තිකයාට එරෙහිව පැමිණිලිකරුවන් සිදු කළ පැමිණිලවලට අනුකූලව හේතු දැක්වීමට හෝ විස්තර කිරීම් යොමු කරන ලෙසට ඔහුව අමතා ලිපියක් සකස්කිරීමට විනය පරීක්ෂණ කමිටුව විසින් සැසිවාරයක් කැඳවිය යුතු ව ඇත.

(ඇ) විනය පරීක්ෂණ කමිටුව විසින් හේතු සහ විස්තර කිරීම් දක්වන ලෙසට ඉල්ලා සිටිමින් ලියාපදිංචි තැපෑලෙන් ඉංජිනේරු වෘත්තිකයාට ලිපියක් යැවිය යුතු ය. එවිට විස්තර කිරීම් සහ හේතු දැක්වීම් සඳහා වූ ලිපිය ලැබීමෙන් පසු හේතු දැක්වීමට සහ විස්තර කිරීම යොමු කිරීමට අවම වශයෙන් සති දෙකක කාලයක්වත් වෘත්තිකයාට ලබා දිය යුතු ය.

(ඈ) විනය පරීක්ෂණ කමිටුව විසින්, මූලික විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කළ මූලික කරුණු ගොනුවේ එක් එක් ලේඛන සහ ප්‍රකාශන පරීක්ෂා කළ යුතු ය. විනය පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් තිදෙනාගේ නිගමනයන් සටහන් කර ගැනීමෙන් පසුව විනය පරීක්ෂණ කමිටුව විසින් විනය පරීක්ෂණයක් කළ යුතු ය.

5. ඉංජිනේරු වෘත්තිකයකු විසින් නියම කළ කාලය තුළ හෝ අන්‍යාකාරයකින් කරුණු පෙන්වාදීමක් හෝ හේතු දැක්වීමක් ඉදිරිපත් කරන්නේ නම් කමිටුව විසින් විනය පරීක්ෂණයකට පියවර ගත යුතු ය. ඔහු/ඇය කරුණු පෙන්වා දීමක් හෝ හේතු දැක්වීමක් ඉදිරිපත් කර ඇත්නම් ඒවා ඉදිරි පරීක්ෂණයේ දී විශේෂයෙන් සලකා බැලීම සඳහා විනය පරීක්ෂණ ලිපි ගොනුවේ ඇතුළත් කළ යුතු ය.

(අ) විමර්ශන කමිටුව විසින් සිදුකළ ලිපි ගොනුවල නිරීක්ෂකයාගේ සහ සොයාගත් කරුණුවලට අනුව විනය පරීක්ෂණ කමිටුව විසින් "චෝදනා පත්‍රයක්" සකස්කළ යුතු ය. විනය පරීක්ෂණ කමිටුව විසින් ඒ චෝදනා පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ඉංජිනේරු වෘත්තිකයාට හෝ ඉංජිනේරු වෘත්තිකයාගේ සම්බන්ධයක් තිබෙන නීතිමය ආයතනයකට හෝ සේවය කරන වෘත්තීය ආයතනයට පැමිණිලිකරු සඳහා වන පිටපතක් සමග දින 14ක් තුළ ලිඛිත පිළිතුරක් ඉදිරිපත් කරන ලෙසට ඔහුට/ඇයට ප්‍රකාශ කරමින් හෝ දැනුම්දෙමින් හෝ නියෝග කරමින් යැවිය යුතු ය.

(ආ) චෝදනා පත්‍රයේ ඉහළ මධ්‍යයේ "ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව" යන නාමය තිබිය යුතු ය. චෝදනා පත්‍රයේ පැමිණිලිකරුගේ නම සහ ලිපිනය පැමිණිලිකරුගේ නාමය සමග ඉහළ දකුණු කෙළවරේ සඳහන් කළ යුතු ය. චෝදනාවට ලක් වී ඇති ඉංජිනේරු වෘත්තිකයාගේ හෝ ඉංජිනේරු ආයතනයේ හෝ උපදේශන ආයතනයේ හෝ නීතිමය ආයතනයක නම සහ ලිපිනය වගඋත්තරකරුවන්ගේ නමින් අංක පිළිවෙලට සඳහන් කළ යුතු ය.

(ඇ) (i) විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් චෝදනා පත්‍රය "ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවයා" ලෙස අත්සන් කළ යුතු ය.

(ii) සභාපතිවරයාගේ ඉහත සඳහන් කළ අත්සන ඉංග්‍රීසියෙන් "by the order of the Engineering Council" යනුවෙන් හෝ සිංහලෙන් "ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ අණ පරිදි" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) සභාපති විනය පරීක්ෂණ කමිටුව ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව යන්නෙන් සඳහන් වන මුද්‍රාව චෝදනා පත්‍රයේ ඇතුළත් විය යුතු ය.

(iv) චෝදනා පත්‍රයේ චෝදනාවන් "චෝදනා පත්‍රය" යන නමින් වන ශීර්ෂය යටතේ තිබිය යුතු ය. මෙම කොටස් ඉහත සඳහන් කළ 5 (ආ) කාර්යය පටිපාටියේ හඳුන්වා දුන් මාතෘකාව යටතේ ප්‍රකාශ කළ යුතු අතර එක් එක් චෝදනා අංක පිළිවෙළට එකිනෙක ගොනු කළ යුතු ය.

(ඈ) විනය පරීක්ෂණ කමිටුව විසින් ඉංජිනේරු වෘත්තිකයකු හෝ වගඋත්තරකරුවකු විසින් සාධාරණ හේතු සහ දුෂ්කරතා දක්වමින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත පිළිතුරු ගොනු කරන දිනය දීර්ඝ කළ හැකි ය. නමුත් දීර්ඝ කරන කාලය පිළිතුරු දීමට නියමිත දිනයෙන් දින 30කට නොවැඩි විය යුතු ය.

(ඉ) ඉංජිනේරු වෘත්තිකයකු හෝ උපදේශක මණ්ඩලයක් හෝ ආයතනයක් නියම කළ කාලයක් තුළ පිළිතුරු යොමු කිරීමට අපොහොසත් වන්නේනම් පිළිතුරු යොමු කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් විනය පරීක්ෂණ කමිටුව විසින් පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කරන සාක්ෂිකරුවන් සහ සාක්ෂි අනුව පැමිණිල්ල පිළිබඳව ඒකපාර්ශවික පරීක්ෂණයක් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(ඊ) (i) ඒකපාර්ශවික හෝ පාර්ශවකරුවන් අතර පරීක්ෂණයක් පවත්වන්නේ ද නැද්ද යන්න පිළිබඳව නොසලකා ඉදිරි නීති කෘත්‍යයන් මෙම කාර්යපටිපාටියේ සඳහන් කර ඇති පරිදි කරගෙන යා යුතු ය.

(ii) සාක්ෂි, සාක්ෂිකරුවන් සහ පැමිණිලි සලකා බැලීමෙන් පසුව විනය පරීක්ෂණ කමිටුව විසින් ඉංජිනේරු කටයුත්තක් කර ගෙන යන්නා වූ ඉංජිනේරු වෘත්තිකයාගේ සහ/හෝ ඉංජිනේරු ආයතනයක හෝ උපදේශක ආයතනයක හෝ නීතිමය මණ්ඩලයක යම් විෂමාචාරයක් පනතේ 40 (1) වන වගන්තිය යටතේ වරදකට සහ/හෝ සභාව විසින් සම්මත කළ වෙනත් යම් නියෝගයක් උල්ලංඝනය කිරීම සඳහා වන වරදකට යටත් වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් වරදක් (වැරදි) සිදුකරන්නෙකු (සිදුකරන්නන්) බවට විනය පරීක්ෂණ කමිටුවට නිරීක්ෂණය වන්නේ නම් විනය පරීක්ෂණ කමිටුව විසින් ඔවුන්ගේ තීරණය විනය පරීක්ෂණ මණ්ඩලයට යොමු කළ යුතු ය.

(iii) විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයාගේ අත්සන සහ මුද්‍රාව යොදා විනය පරීක්ෂණ කමිටුවේ තීරණ සහ යෝජනාවන් අත්සන් කිරීමෙන් පසුව විනය පරීක්ෂණ මණ්ඩලය විසින් එය සභාවේ පැමිණිලි ලේකම්වරයාට යොමු කළ යුතු ය.

(iv) විනය පරීක්ෂණ තීරණය විනය පරීක්ෂණ මණ්ඩලයෙන් ලැබුණ පසුව පැමිණිලි ලේකම්වරයා විසින් ලැබුණ තීරණ වල තොරතුරු ඔහුගේ වාර්තාවල ඇතුළත් කර ගෙන ඒ තීරණ සභාවේ සභාපතිවරයා වෙත භාරදිය යුතු ය.

(v) ඉහත සඳහන් කළ තීරණ ලැබුණ පසුව සභාව විසින් මෙම කාර්ය පටිපාටියේ 9(1) වන ඡේදයේ සඳහන් කරන ලද අවස්ථාවලදී හැර පැමිණිල්ල සම්බන්ධයෙන් විනය පරීක්ෂණ මණ්ඩලය විසින් යොමු කරන විනය පරීක්ෂණ තීරකයන්ගේ යෝජනා ප්‍රකාශයට පත් කළ යුතු ය.

(vi) තීරණවල දී ඉංජිනේරු ආයතනයක් හෝ උපදේශක ආයතනයක් හෝ නෛතික මණ්ඩලයක් විසින් වරදක් (වැරදි) සිදුකර ඇත්නම් සභාව විසින් එසේ කරන ලද ඉංජිනේරු ආයතනය හෝ උපදේශක ආයතනය හෝ නෛතික මණ්ඩලය හෝ මණ්ඩලවලට එරෙහිව පනතේ 40 (1) වන වගන්තිය විසින් සභාව වෙත පවරන ලද නීතිමය හැකියාව තුළ ඒ චෝදනාව (චෝදනා) සඳහා නඩු පැවරීමට පියවර ගත හැකි ය.

6. ඉංජිනේරු වෘත්තිකයෙකු විසින් ඔහුගේ පිළිතුරු නියමිත කාලය තුළ මේ කාර්යපටිපාටියේ 5 (උ) (i) මගින් යෝජනා කළ කාර්ය පටිපාටිය සමඟ ඉදිරිපත් කරන්නේ නම්,

(අ) විනය පරීක්ෂණ කමිටුව විසින් විනය පරීක්ෂණයක් පැවැත්වීමට දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු අතර පැමිණිලිකරු සහ වගඋත්තරකරු/වගඋත්තරකරුවන් යන දෙදෙනාට ම පැමිණිල්ල වෙනුවෙන් නිලධාරියෙකු හෝ/සහ විත්තිය වෙනුවෙන් නිලධරයෙකු පත් කරන ලෙසට අපේක්ෂිත පරීක්ෂණ දිනයට සතියකට පෙර ඔවුන්ගේ ලිපිනය සහ දුරකථන අංකවලට දැනුම්දිය යුතු ය. පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටින නිලධරයා හෝ විත්තිය වෙනුවෙන් පෙනී සිටින නිලධරයා නීතිඥවරයෙකු නො විය යුතු මුත් විශේෂිත නිලධරයෙකුට පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටින හෝ විත්තිය වෙනුවෙන් පෙනී සිටින අතරතුර දී නීතිඥවරයකුගේ සහය ලබා ගැනීමට හැකියාව ඇත.

(ආ) පැමිණිලිකරුවකු පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටීමට නිලධරයකු පත් කර ගෙන නොමැති නම් හෝ එසේ පත් කර ගැනීමට අපොහොසත් වූයේ නම් විනය පරීක්ෂණ කමිටුවේ ලිඛිත බලය ඇතිව පුද්ගලිකව විමර්ශනය සිදු කළ පරීක්ෂකවරයා විසින් පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙය විය යුතු ය.

(ඇ) පරීක්ෂණ දිනයේ දී සිදුකළ හැකි නිරවුල් කිරීම් ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට කමිටුව විසින් පාර්ශව දෙකම කැඳවිය හැකි ය.

(ඈ) චෝදනාව විශේෂිත ස්වභාවයේ කාරණාවකට අදාළ වන අවස්ථාවක කමිටුව විසින් දක්ෂ ස්වාධීන සාක්ෂිකරුවකු සම්බන්ධ කර ගැනීම පිළිබඳව සලකා බැලිය යුතු ය. සාක්ෂි හෝ වැඩිදුරටත් බරපතල හෝ සංකීර්ණ කාරණා සලකා බැලීමෙන් පසුව කැඳවන සියලු පාර්ශවයන් වෙත දීර්ඝ විභාග කිරීමක් සංවිධාන කිරීමට කමිටුව විසින් තීරණය කළ හැකි ය.

(ඉ) මෙම විභාග කිරීම විනිවිද බවින් යුතු සාධාරණත්වයකින් පැවැත්විය යුතු ය. විනය පරීක්ෂණය කැලැන්ඩර් මාස 6ක් ඇතුළත තීරණයක් හෝ යෝජනාවක් සමග හෝ සාධාරණ කාලයක් තුළ නිදහස් කිරීම් පිළිබඳ විනය පියවර යෝජනා සමග පැමිණිලි, නිදොස් කිරීම් හෝ වරදකරුවන් ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතු ය.

7. විනය පරීක්ෂණ කමිටුව විසින් වරදකරු බවට තීරණය වී ඇත්නම් පහත දැක්වෙන තහංචි එකක් හෝ ඊට වැඩි ගණනක් පැනවීම හෝ යෝජනා කිරීම කළ හැකි ය. (නීතියේ මූලිකාංගවල වැඩි සම්භාවිතාවය මත වෘත්තීය විෂමාචාරයක් පිළිගෙන ඔප්පු කර ඇති බවට කමිටුව විසින් තීරණය කරන්නේ නම් යන්න අදහස් වේ).

(අ) වෘත්තිය හැසිරීම් සහ සාරධර්ම සංග්‍රහය අනුගමනය කිරීමට වෘත්තීය ඉංජිනේරුවන්ට මග පෙන්වීම.
(ආ) ඉංජිනේරු වෘත්තිකයන්ට ලිඛිත අවවාද නිකුත් කළ යුතු අතර ඔවුන්ගේ වෘත්තීය වාර්තාවට ඔහුට හෝ ඇයට එරෙහිව රීති අඩංගු කළ යුතු ය.
(ඇ) නිශ්චිතව නියම කරන ලද කාලයක් තුළ නිශ්චිත කාරණා පිළිබඳ පුහුණුවීම්වලට සහභාගි වන ලෙසට ඉංජිනේරු වෘත්තිකයන්ට නියම කිරීම.
(ඈ) ඉංජිනේරු වෘත්තිකයාට චෝදනාවට සම්බන්ධ අනෙක් තැනැත්තාගෙන් සමාව ඉල්ලීමට නියම කිරීම.
(ඉ) 16 (2) වන වගන්තිය යටතේ ඉංජිනේරු වෘත්තිකයෙකුගේ යම් කාල සීමාවක් සඳහා වූ ලියාපදිංචිය අත්හිටුවීම.
(ඊ) 16 (1) අ, (ආ), (ඇ), සහ (ඇ) වගන්ති යටතේ ඉංජිනේරු වෘත්තිකයකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම.
(උ) පනතේ 40 වන වගන්තිය යටතේ සඳහන් කළ දණ්ඩන සඳහා නීතිමය කටයුතු සිදු කිරීම.

8. විනය පරීක්ෂණ කමිටුවේ බහුතර තීරණයන් හා යෝජනාවන් ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ සභාවේ අවසාන සත්‍ය තීරණය විය යුතු ය. තීරණය බහුතර තීන්දුවක් වුවත් එය ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ මෙන් ම විනය පරීක්ෂණ කමිටුවේ විනය පරීක්ෂණ මණ්ඩලයේ නොබෙදුණු සහ ඒකමතික තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය. ඉංජිනේරු සභාව විසින් තීරණය මුද්දරයක් මත දෙදෙනෙකුගේ අත්සනින් පිටසන් කර ප්‍රකාශයට පත් කළ යුතු ය. ඉහත සඳහන් කළ තීරණය හෝ යෝජනා පුද්ගලයන් දෙදෙනෙකු විසින් එනම් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සභාපතිවරයා සහ සභාවේ නිල මුද්‍රාව සමග විනය පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් අත්සන් කළ යුතු ය. සභාවේ නිල තීරණ පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන් වෙත ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

9. (i) සභාව විසින් වෘත්තීය ඉංජිනේරුවරයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ තීරණය ප්‍රකාශයට පත්කිරීමට තීරණය කරන්නේ නම් සභාව විසින් එවැනි අවංලගු කිරීමක් ප්‍රකාශයට පත් කිරීමට සෑහීමකට පත්වීමට පෙරාතුව 16 (1) වගන්තිය මගින් ((අ), (ආ) (ඇ) සහ (ඈ) වලින් එකක් හෝ ඊට වැඩි ගණනක්) නීතිමය සහ/හෝ ආනුශාංගික කාරණා ආවරණය කිරීමක් සහ අනුකූලවීමක් පවතින්නේ ද යන්න තීරණය කළ යුතු ය.

(ii) මෙම කාර්ය පටිපාටියේ 7 (ඉ) හෝ 7 (ඊ) යටතේ අවසාන තීරණය ප්‍රකාශයට පත් කරන්නේ නම් සභාව විසින් 2017 අංක 4 දරන පනතේ 16 (3) වන වගන්තිය යටතේ පියවර ගතයුතු ය. ඒ වගන්තිය අනුව සභාව විසින් ඉංජිනේරු වෘත්තිකයාට ඒ ලියාපදිංචිය අත්හිටුවීම හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට එළඹීමේ හේතු සඳහන් කරමින් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. ඒ ලිපියේ ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ සභාව විසින් ඉංජිනේරු වෘත්තිකයාට පැහැදිලි දැන්වීමක් ලබා දිය යුතු අතර ඔහු/ඇය තීරණය නො සලකා හැරීමට යම් අභියාචනයක් හෝ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එය ඉහත සඳහන් කළ ලිපිය ලැබෙන දින සිට මාසයක කාලයක් තුළ ලියාපදිංචි තැපෑලෙන් සභාව වෙත යැවිය යුතු ය.

10. ඉංජිනේරු වෘත්තිකයෙකු විසින් 9 (1) ඡේදයේ සඳහන් කළ නියම කරන ලද කාලය තුළ දී පැහැදිලි කිරීමක් යවනු ලබන්නේ නම් සභාව විසින් ඒ සවිස්තරය හෝ අභියාචනය සලකා බලා තීන්දුව නො සලකා හරින්නේ ද *නැතහොත්* තීන්දුව ප්‍රතිශෝධනය කරන්නේ ද *නැතහොත්* එය තිබූ පරිදි ම ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳ තීරණයකට එළඹිය යුතු ය.

11. ඉංජිනේරු වෘත්තිකයාගේ සවිස්තරය ලැබීමෙන් හෝ නොලැබීමෙන් මාසයක් ඉකුත් වූ පසුව සභාව විසින් ඔවුන්ගේ තීන්දුව හෝ තීරණය වගඋත්තරකරුට ඔවුන්ගේ තීන්දුව ලෙස ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

තිලක් ද සිල්වා,
සභාපති,
ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව.

EOG 09 - 0233